## 437 බාලොලි බාලොලියේ

බාලොලි බාලොලියේ ////

මිනිස් වෙසින් ආ විමුක්තියේ හඬ
මරිය මවුන් නැලවිල්ලට මුසු වන
ස්වර්ග රාජ්‍යයේ දොරගුලු හැරලන
දෙව් බිළිඳෙක් ගව ලෙන් ගැබ ඉපදුන //

බාලොලි බාලොලියේ ////

දෑත දෙපය දැඩි යදම් බඳින ලදි
දුක් බර වූ ජනතාව අවදි කර
දේව දයා සම කරුණා උල්පත
සීත රැයේ බෙත්ලෙහෙමෙන් මතු විය //

බාලොලි බාලොලියේ ////

පාප අඳුර නෙක බිය සැක දුරලන
නව චින්තනයට මාවත හෙළි කළ
රුවන් තාරකා එළියක් දිස්විය
ගුවන්තලේ හිඳ බැලුම් හෙලා ඇත //